THE INSTITUTE OF CHARTERED ACCOUNTANTS OF SRI LANKA

# SUGGESTED SOLUTIONS

NOT FOR SALE

## KE 5 – Commercial Insight for Management

මාර්තු 2019

All Rights Reserved

# <u>1 වන කොටස</u>

## <u>පිළිතුරු 01</u>

1.1

| | |
|---|---|
| ඉගෙනුම් ඵලය: **1.4.1** | |
| අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 22 | |
| නිවැරදි පිළිතුර: **A** | |

1.2

| | |
|---|---|
| ඉගෙනුම් ඵලය: **2.2.1** | |
| අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 84 | |
| නිවැරදි පිළිතුර: **D** | |

1.3

| | |
|---|---|
| ඉගෙනම් ඵලය: **2.7.1** | |
| අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 101 | |
| නිවැරදි පිළිතුර : **B** | |

1.4

| | |
|---|---|
| ඉගෙනුම් ඵලය: **3.4.1** | |
| අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 122 | |
| නිවැරදි පිළිතුර: **D** | |

1.5

| | |
|---|---|
| ඉගෙනුම් ඵලය: **2.8.2** | |
| අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 99 | |
| නිවැරදි පිළිතුර: **C** | |

1.6

| | |
|---|---|
| ඉගෙනුම් ඵලය: **3.1.1** | |
| අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 118 | |
| නිවැරදි පිළිතුර: **D** | |

1.7

| | |
|---|---|
| ඉගෙනුම් ඵලය: **3.11.1** | |
| අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 190 | |
| නිවැරදි පිළිතුර: **B** | |

1.8

| | |
|---|---|
| ඉගෙනුම් ඵලය: **4.6.1** | |
| අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 329 | |
| නිවැරදි පිළිතුර: **A** | |

NOT FOR SALE

1.9

| | |
|---|---|
| ඉගෙනුම් ඵලය: **5.4.2** | |
| අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 423 | |
| නිවැරදි පිළිතුර: **B** | |

1.10

| | |
|---|---|
| ඉගෙනුම් ඵලය: **6.14.1** | |
| අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 617 | |
| නිවැරදි පිළිතුර: **C** | |

**(මුළු ලකුණු 20)**

NOT FOR SALE

## පිළිතුරු 02

2.1

| |
|---|
| ඉගෙනුම් ඵලය: **1.2.1** |
| අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 16 |
| • අස්පෘෂ්‍යභාවය - සේවා ස්පර්ශ කිරීමට හෝ රස බැලීමට නොහැකිය.<br>• වෙන්කළ නොහැකි බව - සේවා, එය සපයන්නාගෙන් වෙන් කළ නොහැක.<br>• විවිධාකාරත්වය - සමානතාවයක් නොමැතිකම. එක් එක් අවස්ථාවෙහි දී සේවා සැපයීමේ ප්‍රමිතීන් වෙනස් වේ.<br>• නශ්‍යභාවය - සේවා, අනාගතයේ සැපයීම සඳහා ගබඩාකර තබාගත නොහැක.<br>• හිමිකාරත්වය - සේවා, මිලදී ගැනීමක් තුළින් එහි හිමිකාරත්වය පැවරීමක් සිදු නොවේ. |

2.2

| |
|---|
| ඉගෙනුම් ඵලය: **3.6.1** |
| අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 139 |
| (a) මිල ඉල්ලුම් නම්‍යතාවය (PED) = 1.5<br>(b) භාණ්ඩයේ නම්‍ය ඉල්ලුමක් පවතින නිසාවෙන්, ඉල්ලුම් ප්‍රමාණය වෙනස්වන ප්‍රතිශතය, මිල වෙනස්වන ප්‍රතිශතයට වඩා වැඩි වන අතර ඒ නිසා, මිල පහළයාම, මුළු ආදායම පහළ යෑමට හේතු වේ. |

2.3


| |
|---|
| ඉගෙනුම් ඵලය: **2.3.1** |
| අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 67/401 |
| (a) මධ්‍ය කළමනාකරුවන්, සංවිධානයක් තුළ ඒකකයන්, දෙපාර්තමේන්තු හෝ ශාඛාවන් සඳහා වග කියනු ලැබේ. මොවුන් තමාගේ ඒකක වල අදාල කාර්යයන් සම්බන්ධයෙන් ඉහළ කළමනාකාරත්වයට වගකිව යුතු වේ. සංස්ථානික ප්‍රතිපත්තීන් හා පරමාර්ථ වලට අනුකූලව සැලසුම් ක්‍රියාත්මක කිරීමට අදාලව ඔවුන්ගේ ඒකකයන් මෙහෙයවීම සහ සංවිධානකරණය කිරීම, මොවුන්ගේ කාර්යභාරයට ඇතුළත් වේ.<br>(b) විශේෂඥ බලය<br>නීත්‍යානුකූල බලය<br>ඍණාත්මක බලය/නිශේධක බලය |

2.4

ඉගෙනුම් ඵලය: **3.12.1**

අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 485

කෙටිකාලයේදී කම්හලෙහි (plant) පරිමාව වෙනස් (variable) නොවන නිසාවෙන්, කෙටිකාලයේදී AC වක්‍රයේ “u” හැඩය මගින්, ස්ථාවර පරිමාවක් සහිත කම්හලකින් ඉහළ යන සහ පහළ යන ඵලදාවන් පෙන්නුම් කරයි. කෙටිකාලයේදී හීනවන ආන්තික ඵලදා න්‍යාය ක්‍රියාත්මක වීම ලෙස මෙය හඳුන්වනු ලබයි.




2.5

ඉගෙනුම් ඵලය: **4.3.2**

අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 313

- දළ දේශීය නිෂ්පාදිතය රට තුළ සිදුකෙරෙන ආර්ථික ක්‍රියාකාරකම් තුළින් ව්‍යුත්පන්න වෙයි.
- සමහර ජාතික ආදායම් විදේශීය ආයෝජන වලින් ජනිත වන අතර, සමහර ආදායම් රට තුළ විදේශිකයන් විසින් උපයනු ලබන නිසාවෙන්, දළ ජාතික නිෂ්පාදිතය යනු, දළ දේශීය නිෂ්පාදිතයට, විදේශීය ශුද්ධ දේපළ ආදායම එකතු කිරීමෙන් ලැබෙන අගයයි. (දළ ජාතික නිෂ්පාදිතය යනු රටක ජාතීන් (nationals) විසින් ජනනය කරන ආදායමයි.)
- ශුද්ධ ජාතික නිෂ්පාදිතය යනු, දළ ජාතික නිෂ්පාදිතයෙන් ස්ථාවර වත්කම් පරිභෝජනය සහ ජාතික සම්පත් ක්ෂයවීම් අඩු කිරීමෙන් ලැබෙන අගයයි.

2.6

ඉගෙනුම් ඵලය: **: 3.13.1**

අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 218

**අවාසි :**

- ගුණත්ව පාලනය පවත්වාගෙන යාම අපහසු වේ.
- භාණ්ඩ තුළින් වෙළඳ රහස් හෙළිවීමෙන් රහස්‍යභාවය නැතිවීම.
- තරගකාරීත්වයේ වාසි අත්කරගත හැකි මූලාශ්‍රයක් ලෙස යොදාගැනීමට නොහැකි වේ. /තරගකාරීත්වයේ වාසි අත්කර ගැනීමට අපහසුවීම.

NOT FOR SALE

2.7

| ඉගෙනුම් ඵලය: **4.4.2** |
|---|
| අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 323 |
| (a) ව්‍යුහාත්මක සේවා වියුක්තිය.<br>යම් කර්මාන්තයක පවතින තත්වයන්හි හටගන්නා දිගුකාලීන වෙනස්වීම් හේතුවෙන් මෙම තත්වය හටගනී. සේවකයන් ගේ දක්ෂතා කර්මාන්තයට අවශ්‍ය වන දක්ෂතා සමඟ නොගැලපීම නිසා මෙම තත්ත්වය ඇති වේ.<br><br>(b) ඍතුමය සේවා වියුක්තිය.<br>මෙම සේවා වියුක්ති තත්වය හටගන්නේ යම් නිශ්චිත වූ කර්මාන්තයන් තුළය. නිදසුන් ලෙස ගොඩනැගිලි, සංචාරක, ගොවිතැන් දැක්විය හැක. එම කර්මාන්ත තුළ ශ්‍රමයට ඇති ඉල්ලුම වර්ෂය තුළ එම කර්මාන්තය සඳහා පවත්නා ඉල්ලුමේ රටාවන් අනුව වෙනස් වේ. |

2.8

| ඉගෙනුම් ඵල: **4.8.1** |
|---|
| අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 280 |
| • "හරිත නිෂ්පාදන" - පාරිසරිකව සුහදශීලි නිෂ්පාදන හඳුන්වාදීම.<br>• භාවිතයන් වෙනස්කිරීම - සාම්ප්‍රදායික භාවිතයන්/ශිල්පක්‍රම යනාදිය, පාරිසරික සාධකයන්/හෝ අයහපත් ප්‍රචාරණය නිසාවෙන් වෙනස් වේ.<br>• පාරිසරික ගැටළු පිළිබඳ පාරිභෝගියන්ගේ නිසියාකාරව දැනුවත් වී නොතිබීම.<br>• නව ව්‍යාපාරයන් දියත් කිරීමට පෙර පාරිසරික බලපෑම් පිළිබඳ තක්සේරුවක් සිදුකිරීම.<br>• පරිසර දූෂණයකින් තොරව ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා විවිධ මිනුම් කම යොදා ගැනීම. |

2.9

| ඉගෙනුම් ඵලය: **6.2.2** |
|---|
| අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 446 |
| • යන්ත්‍ර උපාංග නිපදවන්නෙක් - පසු විකුණුම් සේවාවන් ලෙස සවි කිරීම සඳහා පුහුණුව, උපදේශනය සහ තාක්ෂණික සහය සපයනු ලැබේ.<br>• අධ්‍යාපන සහ පුහුණු කිරීමේ ආයතන දේශන සහ වැඩමුළු සමඟම අධ්‍යයන වාර්තා, නිබන්ධන සහ අත් පත්‍රිකා ආදිය සපයයි.<br>• ආපනශාලාවක් භාණ්ඩ ලෙස ආහාරපාන සපයයි නමුත් සමස්ථ ආහාර ගැනීමේ අත්දැකීමට අත්‍යාවශයෙන්ම සේවා සැපයීමේ කොටසද ඇතුළත්වේ. |

NOT FOR SALE

2.10

| ඉගෙනුම් ඵලය: **6.15.1** |
| --- |
| අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 627 |
| • **ගුණාත්මකබව** - අවසාන ප්‍රතිඵලය, ව්‍යාපෘති පිරිවිතර යන්ට අනුකූල විය යුතුය. වෙනත් ලෙස දක්වතොත් ව්‍යාපෘතිය විසින් සිදුකිරීමට අපේක්ෂා කළ දෙය ප්‍රතිඵලය තුළින් ළඟාකරදිය යුතුයි.<br>• **අයවැය** - අනුමැතිය ලත් වියදම් ඉකමවා නොයවමින් ව්‍යාපෘතිය සම්පූර්ණ කළ යුතුයි.<br>• **කාලරාමුව**<br>**Timescale** - ව්‍යාපෘතියෙහි ප්‍රගතිය, සැලසුම්කරන ලද ක්‍රියාවලියට අනුකූල විය යුතු අතර, එවිට එකඟවූ දිනට ප්‍රතිඵලය භාවිතයට සුදානම් තත්වයේ පවතී. කාලය, මුදල් වන නිසා සුදුසු කාල කළමනාකරණය පිරිවැය සීමාකිරීම සඳහා ඉවහල් වේ. |

NOT FOR SALE

## 02 කොටස

## පිළිතුර 03

| ඉගෙනුම් ඵලය: 6.6 / 6.7 |
|---|
| අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 477/485 |

(a) කාර්යයන්හි අවසාන නිෂ්පාදිතයේ පහත ලක්ෂණ දක්නට ඇත.

- නිෂ්පාදතයන් වරක් පමණක් නිපදවන අයිතමයන් වේ.
- එම නිෂ්පාදිතයන් පාරිභෝගිකයෙකුගේ විශේෂිත ඇණවුම් අනුව නිපදවයි.
- නිෂ්පාදිතයන් සදහා නිශ්චිත ප්‍රමිතියක් නොමැත.
- විශාල විවිධත්වයන්ගෙන් යුත් නිෂ්පාදිත පරාසයක් පවතී.

(b)

- බෙදාහැරීමේ වේගවත් භාවය.
- අවසාන නිෂ්පාදිතයෙහි ගුණත්වය.
- හැකියාවන් කට්ටලයක් විකිණීම මඟින්, විවිධ වූ පාරිභෝගික අවශ්‍යතාවයන් පරාසයක් සපුරාලීමට හැකිවීම.

(c)

| සේවයේ යොදවන ලද මුළු සේවක සංඛ්‍යාව (N) | කම්හලෙහි මුළු නිෂ්පාදිතය | ආන්තික නිෂ්පාදිතය (MP) | සාමාන්‍ය නිෂ්පාදිතය (AP) |
|---|---|---|---|
| 1 | 10 | - | 10 |
| 2 | 22 | 12 | 11 |
| 3 | 36 | 14 | 12 |
| 4 | 48 | 12 | 12 |
| 5 | 58 | 10 | 11.6 |
| 6 | 64 | 6 | 10.6 |
| 7 | 66 | 2 | 9.4 |
| 8 | 64 | -2 | 8 |

(d) තුන්වන සේවකයා බඳවා ගැනීමෙන් පසු, හීනවන ආන්තික ඵලදාව ක්‍රියාත්මක වීමට ආරම්භ වේ.

**(මුළු ලකුණු 10)**

## පිළිතුර 04

| |
|---|
| ඉගෙනුම් ඵලය: **6.12** |
| අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 554/565/573 |

(a)

- සංවිධානයට ගුණාත්මක ශ්‍රමිකයන් බඳවා ගැනීමට සහාය වීම.
- මානව සම්පත් සැලසුම්කරණය හරහා සංවිධානයන් විසින් හදිසි පුද්ගල හිඟතාවයන් සහ අතිරික්තයන් මඟ හරවා ගනී.
- වර්තමාන මානව සම්පත් තක්සේරු කිරීම සඳහා, මානව සම්පත් සැලසුම්කරණය සංවිධානවලට සහාය වේ.
- අනාගත මානව සම්පත් අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා, මානව සම්පත් සැලසුම්කරණය සංවිධානවලට හැකියාවක් ඇති කරයි.
- දක්ෂ සේවකයන් රඳවා තබාගැනීම හා සේවක පිරිවැටුම අඩු කරම සඳහා සහාය වේ.
- පුහුණු කිරීම සහ රඳවා තබාගැනීම සඳහා අවශ්‍ය කුසලතා පදනම වැඩිදියුණු කිරීම සඳහා එය උපකාර වේ.
- මානව සම්පත් සැලසුම්කරණය හරහා අයවැයකරණය හා පිරිවැය පාලනය පහසුවේ.

(b)

- නිසි කාර්යය සාධන ඇගයීමක් නොමැති විටක දී කළමනාකරුවන්ට සහ සුපරීක්ෂකවරුන්ට තම සේවකයන්ගේ කාර්යසාධනය පිළිබඳව නිසි අවබෝධයක් ලබාගැනීමට නොහැකි වේ.
- කාර්යය සාධන ඇගයීමක් ඇති විටකදී ඔවුන්ට සේවකයන්ගේ අඩුපාඩුකම් පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලැබේ.
- විනිශ්චයන්ට එළඹීම පහසුවන නමුත්, ඒ සඳහා අදාළ පුද්ගලයා ඉදිරියේදීම විස්තරාත්මකව හේතු දැක්වීම හෝ ලිඛිතව දැක්වීම එතරම් පහසු නොවේ.
- විශේෂ පෙළඹවීමක් නොමැතිනම් කළමනාකරුවන්, තම සේවක මණ්ඩලය වෙත, ඔවුන්ගේ කාර්යසාධනය පිළිබඳව ප්‍රතිපෝෂණයක් ලබාදීම සිදුවන්නේ බොහෝ කලාතුරකිනි.
- කාර්යය සාධන ඇගයීමෙහි නිසි ප්‍රමිතියක් නොමැති විටක දී විවිධ පුද්ගලයන් විවිධ නිර්ණායකයන යොදා ගනිමින් කාර්යය සාධන ඇගයීම් සිදු කරයි.

(c)

- කළමනාකරණ ගැටළු.
- සේවක මණ්ඩලය මත පාලනය අවම වීම.
- මෙහෙයුම් පිරිවැය ඉහළ යාහැකි වීම.
- සේවකයන් ඉවත් කෙරේද යන බිය (Fear of being laid off)

**(මුළු ලකුණු 10)**

NOT FOR SALE

## පිළිතුර 05

| | |
|---|---|
| ඉගෙනුම් ඵලය: **5.2** | |
| අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 394/383 | |

(a) වාසි

1. විශේෂඥ දැනුම එකට ඒකරාශී වීම. මෙය සිදුවනුයේ විශේෂ කාර්යයන් සඳහා ශ්‍රමය බෙදා වෙන්කිරීම තුළින් වන විශේෂීකරණය හේතුවෙනි.
2. ද්විත්වකරණය වැළැකවීම.
3. ශ්‍රිතිය විශේෂඥවරුන් බඳවාගැනම,කළමනාකරණය සහ සංවර්ධනය කිරීම සඳහා පහසුකම් සැලසේ.
4. මධ්‍යගත ව්‍යාපාර සඳහා මෙය සුදුසු වේ.

අවාසි

1. පාරිභෝගිකයා සහ නිමැවුම් වලට වඩා මෙහිදී අවධානය යොමු කෙරෙනුයේ අභ්‍යන්තර ක්‍රියාවලි සහ යෙදවුම් මතයි.
2. ශ්‍රිතයන් අතර සන්නිවේදන ගැටළු ඇතිවිය හැක.
3. දුර්වල සම්බන්ධීකරණය, විශේෂයෙන් උස් සංවිධාන ව්‍යුහයක් දක්නට ලැබේ නම් මෙවැනි තත්වයක් දැකිය හැක. වෙනත් කාර්යකට හෝ දෙපාර්තමේන්තුවකට අදාලව එක් කාර්යයක්/දෙපාර්තමේන්තුවක් විසින් ගනු ලබන තීරණ ඉහළට යොමුකළ යුතුවීම නිසාත්, ඒවා ඉහළ මට්ටමකදී සලකා බැලිය යුතුවීම නිසාත්, ඉහළ කළමනාකරණයේ ප්‍රමාණය වැඩිවිය හැක.
4. ශ්‍රිතමය ව්‍යුහයන්, තොරතුරු සහ වැඩ ගලායාම් සම්බන්ධයෙන් සිරස් බාධාවන් ඇති කරනු ලබයි.

(b)

- නාමමාත්‍ර සංවිධාන: සංවිධානය, තනි පුද්ගලයන්ගෙන්, කණ්ඩායම් වලින්, සමාගම් වලින් හෝ ඇල්මැති පාර්ශ්වයන්ගෙන් සමන්විත වේ. සාමාජිකයන් භූගෝලය වශයෙන් විසිර සිටින අතර, සංවිධානය, භෞතික පරිශ්‍රයන් රහිතව, අන්තර්ජාලය තුළ ඉලෙක්ට්‍රෝනිකව සංවිධානයක් ලෙස පැවතීම මෙහිදී සිදුවේ.

- Hollow සංවිධාන: මානව සම්පත් සහ කාර්යයන් මධ්‍ය සහ මධ්‍ය නොවන කාර්යයන් වශයෙන් බෙදා වෙන්කොට පවතී. සියළුම මධ්‍ය නොවන ක්‍රියාවලි සහ කර්යයන් බාහිර ආයතන වලින් ලබාගනු ලැබේ. එවිට Hollow සංවිධානයකට තම මධ්‍ය කටයුතු කෙරෙහි අවධානය යොමු කළ හැක.

- Modular සංවිධාන: භාණ්ඩ හෝ සේවාවල විවිධ කොටස් සහ උපාංග, විවිධ සැපයුම්කරුවන්ට බාහිර සේවාර්ථනය (outsource) කරනු ලැබේ. ආයතනය තුළ රඳවාගන්නා පුද්ගලයන්, මෙම උපාංග ඒකරාශී කිරීම හෝ සම්බන්ධ කිරීම තුළින් අවසාන භාණ්ඩ හෝ සේවා නිපදවීම සිදු කරයි. මෙම ව්‍යුහය තුළින් සංවිධානයට වඩාත් නම්‍යශීලී වීමට සහ වෙළඳපල අවශ්‍යතා සඳහා වඩා ඉක්මනින් ප්‍රතිචාර දැක්වීමට අවස්ථාව සලසා දෙනමුත් , එහි පැවැත්ම, විශ්වාසවන්ත සැපයුම්කරුවන් මත රඳා පවතී

**(මුළු ලකුණු 10)**

NOT FOR SALE

## පිළිතුර 06

| | |
|---|---|
| ඉගෙනුම් ඵලය: **4.5** | |
| අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 346/347 | |

(a)

- රජය මගින් විදේශ මුදල් සංචිතයන් වියදම් කිරීම හෝ ඒවා පවත්වාගෙන යාම අවශ්‍ය නොවේ.
- වෙළඳ ගිණුමේ හඟයන් හෝ අතිරික්තයන් ස්වයංක්‍රීයව නිවැරදි වේ.
- විනිමය අනුපාතිකයන් පවත්වා ගෙන යෑම සඳහා අහිතකර ආර්ථික ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීමට සිදු නොවේ.
- බෙදාහැරීමේ කාර්යක්ෂමතාව දිරිගැන්වීමක් සිදුවේ.
- වෙළඳ කම්පනයන් සඳහා ස්වයංක්‍රීය ගැලපීමක් සෑදවේ.
- බැංකු ආරක්ෂාකර ගැනීම සඳහා අවසාන උපාය වශයෙන් ණය දෙන්නා ලෙස කටයුතු කිරීමේ හැකියාව (Lender of Last Resort capability) මහ බැංකුව විසින් තමා වෙත තබාගනී.
- මල්‍ය නිදහස්භාවය.

(b)

- සමාගමේ මූල්‍ය පිරිවැය (උද්ධමනකාර තත්වයකට පත්වේ.) ඉහළ යය. රටක දේශීය මුදල් ඒකකය ඇ.ඩොලරයට සාපේක්ෂව දුර්වල වනවිට ඩොලර් වලින් දක්වන වගකීම් එම රටේ මුදල් ඒකකවලින් දක්වන විට වඩා වැඩි වටිනාකමක් පෙන්වන අතර එම නිසාම මූල්‍ය පිරිවැයද ඉහළ වටිනාකමක් පෙන්වයි.
- එසේම ණය ආපසු ගෙවීම්ද ඉහළ යනු ඇත.
- ඔවුන් ඇ.ඩොලර් වලින් ඉන්වොයිස් වෙන් කිරීම සිදුකර ඇති නිසා, සමාගමට ජාත්‍යන්තර කටහඬ ව්‍යාපාරයෙන් වැඩිපුර ඉපයීමට හැකිවනු ඇත. කෙසේනමුත්, ජාත්‍යන්තර ඇමතුම් අඩුවීම නිසාවෙන ඩොලර් ඉපයීම් පහළ යනු ඇත.
- එහි ප්‍රතිඵලයක් ලෙස සමාගමේ ලාභය පහළ යනු ඇත.

(c)

- විනිමය විචලනයන්ට එරෙහිව ස්වාභාවිකව ආරාක්ෂාව (natural hedge) සපයමින්, ණය ගැනුම්කරු විසින් ඩොලර් වලින් ආදායම උත්පාදනය කරන්නේ නම්, පරිවර්තනයේදී වන විදේශ විනිමය අලාභයන් අවම කර ගත හැක.
- සමාගමට, ඩොලර් අවශ්‍ය වීමට පෙර, කල්වේලා ඇතිව, ඩොලර් මිලදී ගැනීමට හැකි අතර SWAP, future කොන්ත්‍රාත් යනාදිය කෙරෙහි යොමුවීමද සිදුකළ හැක.
- ක්‍රියාකාරකම් දේශීය වෙළඳපොළ වෙත බාහිර සේවාර්ථනය කිරීම.

**(මුළු ලකුණු 10)**

NOT FOR SALE

**03 කොටස**

**<u>පිළිතුර 07</u>**

| ඉගෙනුම් ඵලය: 3.5.1 , 3.7.1/3.11.1 |
| --- |
| අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 6 වන පරිච්ඡේදය |

(a)

සමතුලිතයේදී Qd = Qs

1300-2P = 100+ 2P

P = 300A$

Q = 700


(b)

(i) ශ්‍රම සැපයුමේ හිඟය.

මෙය වේතන ඉහළ නංවන අතර එය නිෂ්පාදන පිරිවැය ඉහළ නංවයි.

මෙය සැපයුම් වක්‍රය වමට විතැන් කරයි. (S සිට $S_1$ දක්වා).

මෙය මිල ඉහළ යාමකට ( P සිට $P_1$ දක්වා) සහ ප්‍රමාණය පහළයාමකට (Q සිට $Q_1$ දක්වා) හේතුවේ.





NOT FOR SALE


(ii) කෘතිම කුරුදු වල අඩු මිල

කෘතිම කුරුදු සඳහා වන අඩු මිල නිසාවෙන්, ස්වාභාවික කුරුදු සඳහා වන ඉල්ලුම අඩුකරමින්, කෘත්‍රිම නිෂ්පාදන සඳහා වන ඉල්ලුම ඉහළයයි.

මිලගණන් අඩු කරමින් (P සිට $P_1$ දක්වා) සහ ප්‍රමාණය අඩුකරමින් (D සිට $D_1$දක්වා) ඉල්ලුම් වක්‍රය ඇතුළතට විතැන් වේ. (Q සිට $Q_1$ දක්වා)




(c)




රජය විසින් සහනාධාරයක් හඳුන්වා දුන් විට, සැපයුම් වක්‍රය S සිට $S_1$ දක්වා විතැන් වේ. එහි ප්‍රතිඵලයක් ලෙස නිපදවන සමතුලිත ප්‍රමාණයෙහි $Q_1$ දක්වා වන විතැන්වීමක් සිදු වන අතර එය වෙළඳපලෙහි විකිණිය හැකි මිල $P_0$ දක්වා අඩු කරන අතර ඒ අනුව සහනාධාරයෙහි බලපෑම් දෙකක් ඇත.

සමතුලිතයේදී සපයන ප්‍රමාණය ඉහළ යනු ඇත. ($Q_0$ සිට $Q_1$)

මිල පහළ යනු ඇති අතර ($P_0$ සිට $P_1$ දක්වා) මිලෙහි සිදුවන පහළයාම, සහනාධාරයෙහි වටිනාකමට වඩා අඩුවේ.

| | | |
|---|---|---|
| සහනාධාර පරිවැය | = | ABDE |
| පුහු අලාභ | = | BCD |

(d)

- කෘත්‍රිම කුරුදු මත වක්‍ර බදු පැනවීම (ආනයන තීරුබදු /තීරුබදු). මෙය සැපයුම අඩුකරන අතර මිල ගණන් ඉහළ නංවයි. එම ඉහළ යන මිල ගණන් ආකිස්ථානයෙන් මිලට ගත් ප්‍රමාණයන්ගේ අඩුවීමකට හේතුවේ.
- කෘත්‍රිම කුරුදු ආනයනය මත සීමාවන් පැනවීම මඟින් ආකිස්ථානයේ කෘත්‍රිම කුරුදු (availability) අඩුකර ඇත.
- දේශය ගොවීන්ට සහනාධාරයන් ලබා දීම.

(e)

- ගොවීන් විශාල සංඛ්‍යාවක් කුරුඳු වගාකිරීම.
- භාණ්ඩය සමජාතීය වීම.
- එක් ගොවියෙකුට මිල ගණන් කෙරෙහි බලපෑම් කිරීමට නොහැකිවීම.
- පිවිසුම්, පිටවීම් බාධාවන් නොමැති ලෙස පෙනීයාම

එනයින් එය පූර්ණ තරඟකාරී තත්වයකි.

(f) ශ්‍රම හිඟය සහ කෘත්‍රිම කුරුඳු වලින් එන තරඟකාරීත්වය නිසා, ගොවීන් අලාභ ලබයි. (පිරිවැය ඉතා ඉහළ වේ.)

එම නිසා, පිවිසුම් පිටවීම් බාධාවන් නොමැති වීමෙන්, ගොවීන් කර්මාන්තයෙන් බැහැර වනු ඇත. ගොවීන්ට සැපයූ සහනාධාරය නිසා පෙර ඇති වූ අලාභ අඩු කිරීමක් සිදුකරයි.

ගොවීන් සාමාන්‍ය ලාභ උපයන විට, පිටවීම නවතිනු ඇත.

**(මුළු ලකුණු 20)**

NOT FOR SALE

THE INSTITUTE OF CHARTERED ACCOUNTANTS OF SRI LANKA

## නිවේදනය

මෙහි ලබාදුන් පිළිතුරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් (ශ්‍රී ලංකා ව.ග.) පමණක් ලබාදෙන ලද අතර, එම පිළිතුරු ඔබ විසින් එය "එසේම" යන පදනම මත පිළිගත යුතු වේ.

එම පිළිතුරු "ආදර්ශ පිළිතුරු" ලෙස අදහස් නොකරන නමුත් ඒවා බොහෝදුරට suggested solution ලෙස දක්වේ.

පිළිතුරු වලින් ප්‍රධාන අරමුණු දෙකක් ඉටුකෙරේ. ඒවා නම්,

01. විභාග ප්‍රශ්නයකට යෝජිත විසඳුමක් සඳහා සවිස්තරාත්මක නිදසුනක් (උදාහරණයක්) සැපයීම සහ,

02. ශිෂ්‍යයන්ට විෂය පිළිබඳව තොරතුරු පර්යේෂණය කිරීම සඳහා අත්වැලක් සැපයීම සහ විෂය පිළිබඳව ඔවුන්ගේ අවබෝධය සහ අගය වර්ධනය කිරීම.

    මෙම යෝජිත විසඳුම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ශ්‍රී ලංකා ව.ග.) කිසිඳු ප්‍රතිඥාභාරයක් ලබා නොදෙන නිසා ඒ සම්බන්ධව කිසිඳු අගතියකට පත්වීමක් පිළිබඳව මැසිවිල්ලක් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) එරෙහිව ඉදිරිපත් කිරීමට ඔබ හට හේතුවක් නොමැත. ඒ කෙසේ වෙතත් ඔබ විසින් යම් නඩුකරයක්, වන්දි ඉල්ලීමක්, පෙත්සමක්, තර්ජනය කිරීමක් හෝ බලවත් ඉල්ලීමක් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) එරෙහිව ගොනුකරනු ලැබ එයින් සැලකියයුතු අන්දමේ ජයග්‍රහණයක් ලබා නොගතහොත් ඔබ විසින් එම නඩුකරයට අදාළ සම්පූර්ණ නෛතික ගාස්තු සහ වියදම් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) ගෙවිය යුතු වේ. එනයින්ම මෙම අයිතිවාසිකම හෝ මෙහි විස්තර කෙරෙන හෝ ශ්‍රී ලංකාවේ නීතීන් යටතේ හිමි වෙනත් අයිතිවාසිකම් බලාත්මක කරවා ගැනීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) නෛතික ක්‍රියාමාර්ගයකට යොමුවීමට සිදුවුවහොත්, ඊට අදාළ නෛතික ගාස්තු සහ වියදම්ද ඔබ විසින් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) ගෙවිය යුතුවේ.

---


[2] 2013 ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ශ්‍රී ලංකා ව.ග.) මගිනි.
සියළුම හිමිකම් ඇවිරිණි.

**මෙම ලේඛණයේ කිසිම සටහනක් පතිඋත්පාදනය කිරීම, කුමන හෝ ආකාරයකින් හෝ ක්‍රමයකින් එනම්, ඉලෙක්ට්‍රොනික, යාන්ත්‍රික, ඡායා පිටපත් කිරීම, වාර්තාගත කිරීම හෝ වෙනත් ක්‍රමයකින් සම්ප්‍රේෂණය කිරීම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ශ්‍රී ලංකා ව.ග.) පූර්ව ලිඛිත අවසරයකින් තොරව සිදු නොකළ යුතුය.**


NOT FOR SALE